
# කුනු කන අලි



කතාව හා සිතුවම්

කායා විතානගේ

# කුණු කන අලි

**කතෘ**

## ශයිලි කායා විතානගේ

**මහාමායා බාලිකා විදුහල**

**3 ශ්‍රේණිය** C

**කතෘගේ වෙනත් කෘති**

- ගෙදර යුද්ධයක්
- සරුංගල් හීනය
- ගොරකා යකා
- නංගිට ඔවදන්

**කෘතිය පළ කරන දිනය - 2026/05/10**

ISBN 978-624-211-235-0

# පිදුම

අම්පාර මාගේ ළමා කාලයේ සුන්දරතම පරිච්ඡේදයයි.

ළමා වියේ උපරිම නිදහස, සෙනෙහස සහ අත්දැකීම් එලෙසින් විඳ ගැනීමට ලැබීම මා ලද භාග්‍යයකි.

ඉතා කුඩා කල සිට බුද්ධංගල වන්දනා කිරීමට යන අතරතුර නිරතුරුව දකින්නට ලැබුණු කුණු කන්ද අසල සැරිසරන අලි ඇසුරින් මෙම කතාව ලියැවුණි. එය ලියන අතරතුර මගේ මතකයට නැගුණේ අපේ මොන්ටිසෝරියේ චිත්‍ර ප්‍රදර්ශනය සඳහා අප ඇඳි "කුණු කන අලි" චිත්‍රය නැරඹීමට පැමිණි අපේ සුමන ස්වාමීන් වහන්සේය.

මගේ ළමා කාලයේ සමීපතම ස්වාමීන් වහන්සේ වූ උන්වහන්සේට මෙම පොත ගෞරවයෙන් පුද කරමි.

කායා විතානගේ



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.


ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලූ දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.


ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලූ දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලූ කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10


මම පුංචි කාලේ හිටියේ අම්පාරේ.අපි හැමදාම හවසට කුනු දාන්න කුනු කන්දට යනවා.




කුනු කන්ද කියන්නේ මිනිස්සු කුනු දාන තැන.හැමෝම කුනු දාන නිසා එතන කුනු වලින් කුනු කඳු හැදිලා තියෙන්නේ.හරිම ගඳයි.හැමතැනම කුනු.කුනු කන්න හරක්,බල්ලෝ,පූසෝ,කුරුල්ලෝ,කපුටෝ පිරිලා.



හවසට එතනට වෙනම යාලුවෝ ටිකක් එනවා.කලුම කලු ගල් වගේ අලි.මහත අලි,ලොකු අලි,උස අලි,කොට අලි,අලි පැටවු ගොඩක් අලි ඉන්නවා.




අම්මා කිව්වෙ අලි ඉන්නේ කැලේ කියලා.කන්නේ කොල කියලා.ඒත් මම අලි දැක්කේ කුනු කන්දෙදි.එයාලා කන්නේ කුනු.



මේ අලි පවුලට අලුත් බබෙක් එකතු වෙලා.එයා හරි චූටියි,දඟ පාටයි.කුනු ඔලුවෙ දා ගන්න එයා හරි ආසයි.මම එයාට කියන්නේ නෙලී කියලා.

නෙලී බලන්න මම හැමදාම අම්මා තාත්තා එක්ක කුනු කන්දට යනවා.



එකදවසක් නිවුස් වලට නෙලීව TV එකේ පෙන්නුවා.ඩොක්ට අන්කල් කෙනෙක් කතා කලේ.නෙලි මැරිලලු.හේතුව කුනු කාපු නිසාලු.සිලි මලු බඩ ඇතුලේ  හිර වෙලාලු.

නෙලීගේ අම්මා තාත්තාට කොච්චර දුක ඇතිද?

මට හරිම දුකයි.කෑ ගහලා අඩන්න හිතුනා.



"ඒ කියන්නේ අම්මේ තාත්තේ නෙලී මැරුණේ අපි දාපු කුනු කාපු නිසාද?

අපිත් පලතුරු,එළවළු,පොලිතින්,ප්ලාස්ටික්,වීදුරු,ටින් දාන්නේ එකම බාල්දියටනේ.එතකොට නෙලි මැරුණේ ප්ලාස්ටික් කැවිලද?වීදුරුවකට බඩ කැපිලද?" අපි හැමෝටම හොඳටම ඇඬුනා.



ඊට පහුවෙනිදම තාත්තා කඩේ ගිහින් බාල්දි තුනක් ගෙනාවා.එකක කඩදාසි කියලා ගැහුවා.එකක වීදුරු කියලත් අනිත් එකේ යකඩ හා ටින් කියලත් ගැහුවා.දිරන එලවළු,පලතුරු,කොල වගේ දේවල් දාන්න කොම්පෝස්ට් බින් එකක් ලෑස්ති කරලා දුන්නා.




අපි අපේ ගෙදරින් පටන් ගත්තා.දැන් අපිට පුළුවන් අනිත් අයටත් කියා දෙන්න.

අවාසනාවකට මේක ඇත්ත කතාවක් යාළුවනේ.






# කතුවරියගෙන් පණිවිඩයක්



**ආදරණීය චූටි නංගිලා සහ මල්ලිලා,**

**මේ පොතේ කතාව ඇත්තම කතාවක්. මගේ ළමා කාලය ගෙවුණේ සුන්දර අම්පාර නගරයේයි.**

**අපේ ගෙදර කුණු බැහැර කිරීමට අපි නිතරම කුණු බැහැර කරන ස්ථානයට යනවා. ඒ යන බොහෝ අවස්ථාවලදී කුණු කන්න පැමිණි අලි දැකගන්න ලැබෙනවා. ඇත්තටම අපි අලි බලන්න ඕනෑ වුණත් යන්නේ එම ස්ථානයටයි.**

**නමුත් කුණු සමග ප්ලාස්ටික් සහ පොලිතීන් ද මිශ්‍ර වී තිබෙන නිසා, කුණු ආහාරයට ගන්නා අලින්ගේ ජීවිත අනතුරට පත්වෙනවා. ඇතැම් විට ඔවුන් මිය යනවා. අපි කුණු නිසි ලෙස වර්ග කර බැහැර කළා නම්, මේ අහිංසක සතුන්ගේ ජීවිත බේරාගන්න හැකි වන්නට තිබුණා.**

**ඒ නිසා අපි හැමෝම පරිසරය ආරක්ෂා කරමින්, කුණු වර්ග කර බැහැර කිරීමට පුරුදු වෙමු. එවිට සතුන්ටත් මිනිසුන්ටත් සුරක්ෂිත පරිසරයක් ගොඩනැගිය හැකියි.**

**මෙම පොත ලියන අතරතුර මට මගේ ආදරණීය පන්තිභාර ගුරුතුමියත්, පළමු වසරේ සිට මේ දක්වා මට ඉගැන්වූ සියලුම ගුරුතුමියන්වත් නිතරම මතක් වුණා. මගේ අඩුපාඩු පෙන්වා දී මා දිරිමත් කළ සියලුම ගුරුතුමියන්ටත්, ලේඛන කලාවට අපව යොමු කරන මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ගරු විදුහල්පතිතුමියටත් මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.**

**කායා විතානගේ**

**3 වසර - C**

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)